# 2021

# සම්පත් පැතිකඩ



## ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

## ඉංගිරිය

http://www.ingiriya.ds.gov.lk/

https://www.facebook.com/dsigiriya/

# පිදුම

දිනෙන් දින සංවර්ධනය වන, වෙනස් වන ආර්ථික, සමාජ, සංස්කෘතික පරිසරයක් හිමි ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පිළිබඳ තොරතුරු පරිශීලනය කරන සිසු දරුවන් ඇතුළු සමස්ත ප්‍රජාවෙහි දැනුවත් භාවය උදෙසා පිදෙන ගෞරවනීය තිළිණයයි.

# ප්‍රාදේශීය ලේකම්ගේ පණිවිඩය



2000 වර්ෂයේ දී හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් වෙන් කොට පිහිටුවන ලද ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ වන විට පුරා විසි වසරක් සම්පුර්ණ කරමින් සිටී. එදා මෙදා තුර ප්‍රදේශයේ ආර්ථික, සමාජ, සංස්කෘතික හා අධ්‍යාපනික තොරතුරු එක්රැස් කරමින් වර්ෂයක් පාසා සකස් කරනු ලබන සම්පත් පැතිකඩ මෙවරද ඔබ අතට පත් කරනු ලබන්නේ හද පිරි සතුටිනි.

රට පුරා පවතින කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දැඩි දුෂ්කරතා මධ්‍යයේ තොරතුරු ඒකරාශී කොට රටේ වර්තමාන හා අනාගත පරපුර වෙත පරිශීලනය සඳහා මෙම සම්පත් පැතිකඩ එළිදක්වන්නේ ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තොරතුරු සොයා වෙහෙසෙන ඔබ සඳහාමය.

ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සොබා සෞන්දර්යයෙන් අනූන වූ ඉතා රමණීය ග්‍රාමීය පරිසරයක් ඇති සශ්‍රීක භූමි ප්‍රදේශයකි. පුරා විද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම් රාශියකට උරුමකම් කියන්නකි. විවිධ ජාතීන් මෙන්ම විවිධ ආගම් අදහන ජනතාවක් සිටියත් ඔවුන් ඉතා සහයෝගයෙන් සාමකාමී දිවිපෙවතක් ගත කරනු දැකිය හැකිය.

මෙම සියලුම ජනතාවගේ සමාජ, ආර්ථික සුභ සිද්ධිය නංවාලීම පිණිස ප්‍රදේශයේ ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය ලෙස අප වෙත පැවරෙන්නේ අසීමිත වගකීමකි. මෙම වගකීම ඉටු කරලීම උදෙසා නිවැරදි දත්ත මත පදනම්ව නිවැරදි සැලසුම් සකස් කිරීමට අවශ්‍ය මූලික මග පෙන්වීම මෙම සම්පත් පැතිකඩ තුළින් යම් මට්ටමකට ඉටු කරනු ලබයි. එමෙන්න විවිධ අවශ්‍යතා වෙනුවෙන් තොරතුරු සොයා එන විවිධ කණ්ඩායම් උදෙසා අවශ්‍ය තොතරුරු ලබා ගැනීමට මූලාශ්‍රයන් ලෙස ද මෙම ග්‍රන්ථය භාවිතයට අවස්ථාව සලසා දීම ද අපගේ තවත් අරමුණකි. එම අරමුණු සඵල කර ගැනීමට ඔබ හට හැකි වේවායි ප්‍රාර්ථනා කරමි.

අයිරංගනී වීරසිංහ
ප්‍රාදේශීය ලේකම්
ඉංගිරිය

# නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ පණිවිඩය



ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක සම්පත් පැතිකඩ යනු ප්‍රාදේශීය මට්ටමේ සංවර්ධනයේ අතීත, වර්තමාන, අනාගත ස්වභාවය දැක්වෙන නිහඬ කතාන්දරයකි.

ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ග්‍රාම නිලධාරී වසම් 31කින් සමන්විත කුඩා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වුව ද සංවර්ධනය ගමට ගෙන යෑමේ දී ඊට අවශ්‍ය ආර්ථික, සමාජීය, සංස්කෘතික, ආගමික, පාරිසරික හා අධ්‍යාපනික සාධක තුළින් මේ වන විට ලබා ගෙන ඇති ප්‍රගතිය හා අනාගතයේ ළඟා කර ගත යුතු ඉලක්ක කුමක්ද යන්න තීරණය කිරීමට සියලු පාර්ශව වලට අවශ්‍ය භූමිකාවක් සම්පත් පැතිකඩ පරිහරණය කිරීමෙන් ලැබේ. 2021 වර්ෂයේ සම්පත් පැතිකඩ ඊට අවශ්‍ය භූමිකාව ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි.

මෙම සම්පත් පැතිකඩ සකස් කිරීමේ දී ඊට අවශ්‍ය තොරතුරු ලබා දීමේ දී ප්‍රාදේශීය ලේකම්තුමියගේ නායකත්වය යටතේ කොට්ඨාශයේ සියලුම රාජ්‍ය ආයතන හා ග්‍රාම නිලධාරී වසම් වලට අනුයුක්ත ආර්ථික සංවර්ධන නිලධාරීන්, ග්‍රාම නිලධාරීන්, සමෘද්ධි සංවර්ධන නිලධාරීන්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාරවරුන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරීන් ඇතුළු විශාල කණ්ඩායමක් දායකත්වය සැපයූ අතර ඔවුනට මාගේ ස්තූතිය ප්‍රකාශ කරමි. එසේම මෙම සම්පත් පැතිකඩ නිර්මාණශීලීව සකස් කිරීමට හා පරිගණක කටයුතු කිරීමට සැලසුම් අංශයේ සංවර්ධන නිලධාරි සනලි දිල්හානි මෙනවියට හා දිලූපා සුබසිංහ මිය දැක්වූ දායකත්වය අගය කොට සලකමි. එසේම මෙම කාර්යයට නන් අයුරින් සහය දැක්වූ සැලසුම් අංශයේ අංශ ප්‍රධානී ඇතුළු සියලු දෙනාටත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ක්ෂේත්‍ර හා අනෙකුත් අංශ වල සියලුම දෙනාට ස්තූතිය ප්‍රකාශ කරමි.

ඒ. ලාල් ප්‍රියන්ත<br>
නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්)<br>
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>
ඉංගිරිය

# පටුන

1. හැඳින්වීම ........................................................................................ 8
1.1 පසුබිම ........................................................................................ 9-11
1.2 පිහිටීම ........................................................................................ 12-16
1.2.1 ග්‍රාම නිලධාරී වසම් හා ගම් කාණ්ඩ ........................................................ 31
1.2.2 පරිපාලන ව්‍යුහය ........................................................................ 22-28
1.3 දේශගුණික හා කාලගුණික තොරතුරු ........................................................ 29-30
2. ජනගහනය ........................................................................................ 31
2.1 ජන ඝනත්වය හා ව්‍යාප්තිය ........................................................................ 32-35
2.2 වයස් මට්ටම අනුව ජන සංඛ්‍යාව ........................................................................ 36-37
2.3 ජන වර්ග අනුව හා ආගම් අනුව ජනගහනය ........................................................ 38-39
2.4 ලියාපදිංචි ඡන්ද දායකයින් ........................................................................ 40-41
3. ශ්‍රම බලකාය හා රැකියා වියුක්තිය ........................................................................ 42
3.1 රැකියා නියුක්තියේ ව්‍යාප්තිය ........................................................................ 43
3.1.1 රාජ්‍ය, පෞද්ගලික, ස්වයං හා විදේශ රැකියා ........................................................ 43-44
3.2 රැකියා වියුක්තියේ ව්‍යාප්තිය ........................................................................ 45
3.3 ආරක්ෂක අංශයේ රැකියා ව්‍යාප්තිය ........................................................................ 46
3.4 විදෙස්ගත පුද්ගලයින් සංඛ්‍යාව ........................................................................ 47
3.5 කර්මාන්ත ........................................................................................ 48-57
4. ඉඩම්,කෘෂි පශු සම්පත් හා අභියෝග ........................................................................ 58
4.1 හැඳින්වීම ........................................................................................ 59
4.2 ඉඩම් පිළිබඳ තොරතුරු ........................................................................ 59-60
4.3 ඉඩම් පරිහරණය ........................................................................................ 61-66
4.4 කෘෂිකාර්මික කටයුතු වල නියැලෙන පවුල් සංඛ්‍යාව ........................................................ 66
4.5 කෘෂිකාර්මික කටයුතු සිදු කරන භූමි ප්‍රමාණය ........................................................ 66
4.6 වී වගාව සම්බන්ධයෙන් වසමට අයත් ඇළ මාර්ග ........................................................ 67
4.7 යල මහ කන්නයේ වී වගාව ........................................................................ 67
4.8 සත්ත්ව පාලනය හා ස්වභාවික සම්පත් ව්‍යාප්තිය ........................................................ 68-70
4.9 ඉඩම් කෘෂිකාර්මික පශු සම්පත් සඳහා පවතින අභියෝග ........................................................ 71
5. පොදු යටිතල පහසුකම් හා භෞතික පහසුකම් ........................................................ 72
5.1 මාර්ග සංකේත අංක හා ප්‍රවාහන පහසුකම් ........................................................ 73
5.1.1 මාර්ග සංවර්ධන අධිකාරියෙහි මාර්ග ........................................................ 74
5.1.2 පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියෙහි මාර්ග ........................................................ 74
5.2 මාර්ග වල ස්වභාවය ........................................................................ 74
5.3 පානීය ජලය, විදුලිය, දුරකථන පහසුකම් පිළිබඳ තොරතුරු ........................................................ 75-76
5.4 නිවස හා සනීපාරක්ෂක පහසුකම් ........................................................ 77-80
5.5 තැපැල් කලාප ........................................................................................ 81
5.6 ප්‍රධාන, උප, නියෝජිත තැපැල් කාර්යාල ........................................................ 81

6. අධ්‍යාපන පහසුකම් ........................................................................................82
6.1 අධ්‍යාපනික පසුබිම ........................................................................................83
6.2 පාසල් වර්ගීකරණය ..................................................................................84-85
6.3 පෙර පාසල් වර්ගීකරණය.........................................................................86-88
6.4 දහම් පාසල් වර්ගීකරණය.........................................................................89-90
6.5 පිරිවෙන් වර්ගීකරණය..................................................................................90
7. සෞඛ්‍ය පහසුකම් ..........................................................................................91
7.1 රෝහල් වර්ගීකරණය ................................................................................92-94
7.2 රෝහල් කාර්යය මණ්ඩල සංඛ්‍යාව...........................................................94-95
7.3 සායන මධ්‍යස්ථාන.........................................................................................96
7.4 ෆාමසි පිළිබඳ තොරතුරු.............................................................................97-99
8. ආගමික හා සංස්කෘතික පසුබිම ..................................................................100
8.1 විහාරස්ථාන ...........................................................................................101-102
8.1.1 ප්‍රදේශයේ ඉපැරණි විහාරස්ථාන වල සංස්කෘතික පසුබිම.........103-104
8.2 කතෝලික දේවස්ථාන...................................................................................105
8.3 කෝවිල්.......................................................................................................105
9. සමාජ සුබසාධන (සහනාධාර) .......................................................................106
9.1 ප්‍රදේශයේ සිටින ආබාධිත සහ රෝගීන් පිළිබඳ තොරතුරු................107-108
9.2 මහජනාධාර පිළිබඳ තොරතරු ...............................................................109-110
9.3 විශ්‍රාම වැටුප්ලාභීන් පිළිබඳ තොරතුරු.....................................................111-112
9.4 රාජ්‍ය හා පෞද්ගලික බැංකු වර්ගීකරණය.....................................................113
10. ආපදා තත්ත්වයන් හා කළමනාකරණය .......................................................114
10.1 ආපදාවට ලක්වන කලාප පිළිබඳ හැඳින්වීම ...........................................115-116
10.2 ප්‍රදේශයට අයත් වන ආපදා තත්ත්වයන්....................................................117
10.3 හානියට ලක් වූ පවුල්.................................................................................118
10.4 අභියෝග......................................................................................................119
11. සංචාරක ආකර්ශනීය ස්ථාන .......................................................................120
11.1 සංචාරකයින්ගේ අවධානය යොමු වූ ස්ථාන.................................121-126
11.2 සංචාරක ආකර්ශනය දිනා ගත හැකි යැයි සිතන සංවර්ධනය කළ හැකි ස්ථාන ..........................................................................................................127-128
12. සංවර්ධන ව්‍යාපෘති.....................................................................................129
12.1 යෝජිත හා කළ යුතු ජල සංවර්ධන ව්‍යාපෘති .......................................130-131
12.2 යෝජිත හා කළ යුතු විදුලි සංවර්ධන ව්‍යාපෘති .............................................132
12.3 යෝජිත හා කළ යුතු මාර්ග සංවර්ධන ව්‍යාපෘති...................................133-134
12.4 යෝජිත හා කළ යුතු බෝක්කු සංවර්ධන ව්‍යාපෘති........................................135
12.5 යෝජිත හා කළ යුතු පාළම් සංවර්ධන ව්‍යාපෘති.............................................136
12.6 යෝජිත හා කළ යුතු ගොඩනැගිලි සංවර්ධන ව්‍යාපෘති...................................137
12.7 යෝජිත හා කළ යුතු වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති.......................................138

13. කාර්යාලීය තොරතුරු....................................................................................139
13.1 සංවර්ධන නිලධාරී නාම ලේඛනය.......................................................140
13.2 ග්‍රාම නිලධාරී නාම ලේඛනය.........................................................141-142
13.3 සමෘද්ධි සංවර්ධන නිලධාරී නාම ලේඛනය ....................................143-144
13.4 කෘෂිපර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරී නාම ලේඛනය........145-146
13.5 යෞවන සමාජ සම්බන්ධ තොරතුරු ...............................................147-148
13.6 ස්වේච්ඡා සංවිධාන හා සමිති සමාගම් පිළිබඳ තොරතුරු.................. 149-152
13.7 ග්‍රාමීය වැඩිහිටි කමිටු පිළිබඳ තොරතුරු.........................................153-154
13.8 ග්‍රාම සංවර්ධන සමිති පිළිබඳ තොරතුරු.................................................155
13.9 මූල්‍ය පහසුකම් සපයන ආයතන සම්බන්ධ තොරතුරු........................156-159
13.10 ප්‍රදේශයේ රාජ්‍ය ආයතන....................................................................160

# පළමු පරිච්ඡේදය

# හැඳින්වීම

# 1.1. පසුබිම

## මෙහවර

**“රාජ්‍ය ප්‍රතිපත්ති වලට අනුකූලව සේවා සැපයීම,
සම්පත් සම්බන්ධීකරණය හා ජනතා
සහභාගීත්වයෙන් යුත් කාර්යක්ෂම, තිරසාර හා
සැලසුම් සහගත සංවර්ධන ක්‍රියාවලියක් තුළින්
ප්‍රදේශයේ ජන දිවිය නංවාලීම”**

## දැක්ම

**“ප්‍රජාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා
පහසුකම් සපයන විශිෂ්ඨතම රාජ්‍ය ආයතනයක්
බවනට පත් වීම”**

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, හොරණ මැතිවරණ කොට්ඨාසයට අයත් 2000 වර්ෂයේ දෙවන කාර්තුවේදී හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙන් වෙන් කොට පිහිටුවන ලද ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය රයිගම් කෝරළයේ නැගෙනහිර කලාපයට අයත් උඩුගහ පත්තුවේ මාවක් ඔයට නැගෙනහිරින් ග්‍රාම සේවා වසම් 31ක් තුළ හෙක්ටයාර් 9204 ක භූමි භාගයක විහිදී ඇත. දිය දහර කඳු හෙල් තැනිතලා හා මිටියාවත් යන සියළු හූ විෂමතාවන්ගෙන් සැදුම්ලත් මෙකී බිම් ප්‍රදේශය ඉතා සුන්දර වූත් රමණීය වූත් ප්‍රදේශයක් ලෙස සැලකිය හැකිය. මෙම කලාපයේ ප්‍රධාන මං සන්ධිය ඉංගිරිය වන අතර පෝරුවදණ්ඩ හා හඳපාන්ගොඩ උප මංසන්ධි වේ.

සබරගමු කඳු වැටිවල ඉම, ඉංගිරිය ප්‍රදේශයෙන් අවසන් වන බැවින් ඉමගිර, ඉංගිරිය වශයෙන් බිඳීවිත් ඉංගිරිය යන නම ලැබුණ බව ජනප්‍රවාදයේ කියවේ. ප්‍රදේශයේ ප්‍රධාන නගරය වන ඉංගිරිය නගරය සුදු අධිරාජ්‍ය වාදීන්ගේ වතු වගා ආරම්භයේ බිහි වූ නගරයකි. එහෙත් ඉංගිරියට තදාසන්නව පිහිටි ඌරුගල නම්බපාන ග්‍රාමයන් කළු ගංගා මිටියාවත පිහිටි සිංහල රජ සමයට නෑකම් කියන ගම් දෙකකි. අතීතයේ බඩු ප්‍රවාහන කටයුතු ගංගා මාර්ගයෙන් සිදු වී ඇති නිසා රත්නපුර ප්‍රදේශයෙන් කළුතර, පානදුර ප්‍රදේශයන්ට භාණ්ඩ ප්‍රවාහනය මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දකුණ, ගිණිකොන මායිම් ආශ්‍රිතව ගලායන කළුගඟ ආශ්‍රයෙන් සිදුවීම නිසාත් එකී මිටියාවතේ පිහිටි ඉහත ගම්මාන වල ඇත අතීතයේ සිට මිනිස් වාසස්ථාන බිහි වී ඇති බව පෙනේ.

මෙයින් ඌරුගල ග්‍රාමයේ ගිණිකොන මිටියාවතේ පිහිටි දැකුම්කළු ස්ථානයක (වක්කලම) සබරගමු ප්‍රදේශයේ සිට පැමිණි පාරු තොටුපලක් පැවති අතර එය අදට ද කලාතුරකින් එන පාරුකරුවන්ගේ ගිමන්හලකි. එකී වක්කලම ඉවුරේ ඇති ගල නිසා මෙම ඉපැරණි ග්‍රාමයට " ඉවුරේ ගල " පසුව උච්චාරණයේ පහසුවට ඌරුගල වූ බව පෙනේ. එකී ඌරුගල ග්‍රාමයට අයත් භූමි ප්‍රදේශයෙන් කොටසක් ඉංගිරිය වශයෙන් නම් කර ඉංග්‍රීසි පාලන සමයේ ඇති කළ ප්‍රධාන මංමාවත් වන පානදුර - රත්නපුර මාර්ගයට හංවැල්ලේ සිට තැනවූ මාර්ගය එකතු වන හංදිය ඉංගිරිය වශයෙන් ප්‍රසිද්ධ වූ බව පෙනේ. වර්තමානයේ කළුතර දිස්ත්‍රික්කයේ ප්‍රධාන නගරයක් වන ඉංගිරිය නගරයේ සිට රත්නපුර, හොරණ, පානදුර, දක්වා ද පාදුක්ක, හෝමාගම, කොළඹ දක්වා ද බුලත්සිංහල මාර්ගය ඔස්සේ දකුණේ නගර කරා යාමට ද ඉතා පහසු හා කඩිනම් මාර්ග පද්ධතියක් නගරය කේන්ද්‍ර කොට පිහිටුවා ඇත.

ප්‍රදේශයේ උතුරු හා බටහිර දෙසින් පිහිටි මාවක් ඔය මිටියාවත විශාල වෙල්යායන් ආශ්‍රිතව පිහිටි අරකාවිල, හඳපාන්ගොඩ, පෝරුවදණ්ඩ වැනි ගම්මාන කෝට්ටේ හා සීතාවක රාජධානි වලට ද නෑකම් කියූ ගම්මාන වේ. තවද ඉංගිරිය ඇල මිටියාවත ද මහ ඉංගිරිය මානාන වැනි පැරණි ජනාවාස තිබූ බව ඉතිහාසයෙන් පෙනේ. අනෙක් සියළු ජනාවාස ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ වතු වගා ආශ්‍රිතව බිහි වී ඇති අතර 1815 න් පසු විශාල තේ, පොල්, රබර් වගාවන් සඳහා දකුණු ඉන්දියාවෙන් ගෙන් වූ දෙමළ ජාතීන්ගේ ජනාවාස වී ඇත.

1972 ඉඩම් පනත යටතේ මෙකී වතු විදේශ ආධිපත්‍යයෙන් මුදා ගැනීමෙන් අනතුරුව ඉහත විශාල වතු ජනතාව අතර කැබලි කොට බෙදාදීම තුළ ඉංගිරිය නගරය තදාසන්නව විශාල ජනගහනයක් ඒකරාශී වේ. පාරිසරික ගැටළු ද බොහෝ සේ වැඩි වෙමින් පවතී.

මෙම කලාපය තුළ උතුරු, ඊසාන හා නැගෙනහිර ප්‍රදේශයන්හි පිහිටි කඳු වැටි වලින් පටන්ගෙන දකුණු ගිණිකොන දෙසට ගලා බැස කළු ගගට එකතුවන ප්‍රධාන ඇලවල් තුනකි. එයින් විශාලතම හා කොට්ඨාසය පුරාම වසාගෙන ගලා යන්නේ මාවක් ඔය වන අතර මඩකඩ මූකලාන මැදින් නම්බපාන ඇල (නාච්චිමලේ දොල) අති සුන්දර දොළ පහරක් වී තිබේ. එහි මැද භාගයේ වම් ඉවුරේ ඇති සේනාසනය (නාච්චිමලේ) දෙස් විදෙස් බැතිමතුන්ගේ හා සංචාරකයන්ගේ සිත් වශී කරන රමණීය භූමි භාගයකි. විවිධ වර්ගයේ වෘක්ෂලතා හා ප්‍රදේශයට ආවේණික කුරුළු වර්ග මෙම රක්ෂිත භූමි භාගයේ සුන්දර බව තීව්‍ර කරයි. ගල් කුළු අතරින් ගලා බසිනා මෙම දොළ පහර තුළ ජීවත්වන මත්ස්‍ය විශේෂ බොහොමයක් වන අතර වියළි කාලයන්හිදී මෙහි පැහැදිලි ඉතා පිරිසිදු දිය නෑමට ජනතාව ද දහස් ගණනින් ඇදී එති. මෙයට අමතරව දොඹගස්කන්ද බටහිර බෑවුමේ පිහිටා ඇති බෝධිනාගල ආරණ්‍ය සේනාසනය ද මෙම ප්‍රදේශයේ ඇති සුන්දර ස්ථානයකි. එහි දකුණු මායිමෙන් ගලා බස්නා කළු ගංගා කොමලිය එහි සුන්දරත්වය වඩාත් වැඩි කරවන්නීය.

ප්‍රදේශය තුළ පිහිටි ප්‍රධාන විහාරස්ථාන අතරින් හඳපාන්ගොඩ ගනේ විහාරය, රත්මල්ගොඩ සාංඝිකාරාමය, ඉංගිරිය දීපාලෝක විහාරය හා ඌරුගල තපෝධනාරාමය මූලික තැනක් ගනී. මෙම විහාරස්ථාන 19 වන සියවසේ අග භාගය තරම් ඉතිහාසයකට උරුමකම් කියන අතර ඒ හා අනුබද්ධිතව බෞද්ධ මිශ්‍රපාඨශාලා වශයෙන් ආරම්භ වූ පාසල් අද වඩාත් දියුණු තත්ත්වයක පවතී. මෙසේ ආරම්භ වී දැනට ප්‍රදේශයේ දියුණුවට පත් පාසල් අතර ඉංගිරිය ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය, මාපුටුගල මහා විද්‍යාලය හා හඳපාන්ගොඩ මහා විද්‍යාලය මූලික තැනක් ගනී. ඉංගිරිය අවට පිහිටි විශාල වතු කේන්ද්‍ර කොට පිහිටුවා ඇති ඉංගිරිය දිසා රෝහල ඉංග්‍රීසි ජාතිකයන් විසින් 20 වන සියවසේ මුල් කාර්තුව තුළ පිහිට වූ දීර්ඝ ඉතිහාසයකට උරුමකම් තියෙන රෝහලකි.

ප්‍රදේශය තුළ ප්‍රධාන වශයෙන් සිංහල බෞද්ධ ජනතාවක් වෙසෙන අතර වතු කේන්ද්‍ර කොට ගත් හින්දු ආගමික ද්‍රවිඩ ජනතාවක්ද ඉතා සුළු වශයෙන් ජීවත් වෙති. කොළඹ යුගයේ කවීන් අතර ජනාදරයට පත් වූ කවිතිලක ධර්මසිරි හරිස්චන්ද්‍ර කිවිඳුන් ඉංගිරිය ගාල්ලෙගම ප්‍රදේශයෙන්ද උපනන්ද බටුගෙදර කිවිඳුන් හඳපාන්ගොඩ ප්‍රදේශයෙන් ද බිහි වී මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය විචිත්‍රවත් කිරීමේ කවිවරු වෙති. තවද ඌරුගල දයාසේන ගුණසිංහ මෙම ප්‍රදේශයේ බිහි වූ විශිෂ්ට ගණයේ පුවත්පත් ගත් කතුවරයෙක් හා කිවියෙක් වූ අතර ඉංගිරියේ මුනිදාස සෙනරත් යාපා මැතිඳුන් ද ප්‍රබුද්ධ ගත් කතුවරයෙකි.

තේ රබර් වගාවන් මූලික කොටගත් ව්‍යාපාර මගින් ජීවනෝපාය සකසා ගන්නා ජනතාවක් මෙන්ම එයට අනුපාතිකව වී වගාව හා ගෙවතු වගාව තම රැකියා මාර්ගය කර ගත් පිරිසක් මෙහි වාසය කරන අතර පසුගිය දශක දෙක තුළ සීඝ්‍ර ලෙස සිදු වූ කාර්මීකරණය තුළ බිහිවූ මහා පරිමාණ ඇගළුම් කර්මාන්ත ආශ්‍රිතව ජීවනෝපාය සකසා ගන්නා ගැමි අර්ධ නාගරික කාන්තා ජනතාවක් ප්‍රදේශය තුළ වැඩි වශයෙන් ජීවත් වෙති.

මෙයට අමතරව ඉතා සුළු කොටසක් විදේශ රැකියා තුලින් ද සාමාන්‍ය පිරිසක් රජයේ හා අනුබද්ධිත වෙනත් රැකියා මගින් ද වඩු පෙදරේරු කර්මාන්ත තුලින් හා ඒ හා බැඳුණු දැව, වැලි ගොඩ දැමීම් ආදී කර්මාන්ත මගින් ද ජීවනෝපාය සකසා ගනිති.

මහා පරිමාණ කර්මාන්ත හෝ ඒ හා සමාන සශ්‍රීක වගා බිම් නොවූවද ඉතා පිරිසිදු වාතාශ්‍රයෙන් හා ජලයෙන් ස්වයං පෝෂිත වූ ප්‍රදේශයේ ජනතාව අර්ධ ග්‍රාමීයවත්, අර්ධ නාගරීකරණය යටතේ සාමකාමී සැහැල්ලු දිවි පෙවෙතක් ගත කරන්නෝ වෙති.

# 1.2.පිහිටීම


INGIRIYA
HORANA
PANADURA
MILLANIYA
BANDARAGAMA
MADURAWALA
BULATHSINHALA
KALUTARA
DODANGODA
AGALAWATTA
PALINDA NUWARA
MATUGAMA
BERUWALA
WALALLAWITA

කළුතර දිස්ත්‍රික්කයේ උතුරු කොටසේ පිහිටි ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා කලටුවාව ජලාශ රක්ෂිතයෙන් ද නැගෙනහිරින් කිරිඇල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයෙන් හා කළු ගඟේ කොටසකින් ද දකුණින් කළු ගඟෙන් ද බටහිරින් මාවක් ඔයෙන් හා පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මලගල මිරියගල්ල ග්‍රාම නිලධාරී වසම් වලින්ද මායිම් වී ඇත.

හෙක්ටයාර 9204 (ව.කි.92.04) විශාලත්වයකින් යුත් මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙන් 5.75% වේ. භූමියේ උන්නතාංශය මුහුදු මට්ටමේ සිට මීටර් 400 ක් දක්වා වන අතර කලාපයේ මධ්‍යම ප්‍රදේශය නැගෙනහිර හා ඊසාන ගිණිකොන කඳු සහිත වේ.

## භූ විෂමතා හා ජලවහනය

භූ විෂමතාවය අනුව ප්‍රධාන කොටස් හතරකි.

1. ගංගා පිටාර තැනි සහිත පහත් බිම් :- වී වගාව ප්‍රධාන වශයෙන් ව්‍යාප්තව ඇති මෙම ප්‍රදේශය බටහිර නිරිත දිග කලාපයේ විහිදී ඇත.

2. බෑවුම් සහිත රැළි බිම් :- මෙම ප්‍රදේශ මීටර් 15 – 40 දක්වා උස් බිම් වන අතර නැගෙනහිර උතුරු හා දකුණු දිශාගතව පිහිටා ඇත. ප්‍රධාන වශයෙන් තේ, රබර් වගාව මේ කලාපයේ දක්නට ඇත.

3. මධ්‍යස්ථව බෑවුම් හා දළ බෑවුම් සහිත හුදකලා කඳු :- මීටර් 40 – 100 දක්වා උස් වූ මෙම ප්‍රදේශය නැගෙනහිර කලාපයේ පිහිටා ඇති අතර වන වගා හා රබර් වගාව ව්‍යාප්තව ඇත.

4. කඳු සහ කඳු වැටි සහිත උස් බිම් :- ප්‍රදේශයේ ඊසාන හා නැගෙනහිර කලාප තුළ විහිදී ඇති රක්ෂිත වනාන්තර හා රබර් වගාව හා සුළු වශයෙන් තේ වගා බිම් මෙම ප්‍රදේශය තුළ දක්නට ලැබේ.




ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය දිවයිනේ බටහිර මුහුදු සීමාවේ සිට කිලෝමීටර් 24 න් ආරම්භවී කිලෝමීටර් 8.8 ක් පමණ රට මැදට විහිදේ.

සමස්තයක් වශයෙන් කොට්ඨාසය පුරාම හුදකලා කඳු පිහිටා ඇති අතර නැගෙනහිර මායිමේ කඳුමය ලක්ෂණ වැඩි වශයෙන් දක්නට ඇත. කොට්ඨාසයේ උසම ස්ථානය කොට්ටියාවත්ත ග්‍රාම නිලධාරී වසමේ පිහිටි අඩි 1165 උස මඩකඩ ගිරංචි කන්දයි. මීට අමතරව ඇදුරගල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි ඇදුරගල කන්ද අඩි 700 ට වඩා වැඩි උසකින් යුක්තවේ. තවද නැගෙනහිර අර්ධයේ තැනින් තැන අඩි 500 ට වඩා උස්වූ හුදකලා කඳු පිහිටා ඇති අතර බටහිර අර්ධයේ ද එවැනිම උස් හුදකලා කඳු දැකිය හැකි මුත් මුළු බිම් ප්‍රමාණයෙන් 60% ක් තැනිතලා ප්‍රදේශ වේ.

කොට්ඨාසයේ දකුණු මායිම ඔස්සේ කළු ගඟ ගලා බසින අතර කලාපයේ විවිධ ප්‍රදේශයන් ගෙන් ගලා බසින ඇල මාර්ග ජාලයන් මෙම ගඟට එක්වේ. නැගෙනහිර අර්ධයෙන් නම්බපාන ඉංගිරිය ඇල මාර්ගයද කොට්ඨාසයේ විශාලම ඇල මාර්ගය වන මාවක්ඔය උතුරින් පටන් ගෙන බටහිර දිශාගතව ගලාවිත් දකුණු මායිම් ගතව කළු ගඟට එක් වේ.

## බෑවුම් කලාප

මෙම කොට්ඨාසයේ භූමිය 66%ක් ඉතා අඩු බෑවුම් සහිත ප්රදේශ වන අතර එකී ප්‍රදේශ කලාපයේ බටහිර ගතව විහිදී යයි. මද බෑවුම් සහිත කලාප ප්‍රදේශයේ උතුරු හා මධ්‍යම ප්‍රදේශ ගතව පිහිටා ඇති අතර කඳු හා මද බෑවුම් සහිත කලාප විශේෂයෙන් ඊසාන හා නැගෙනහිර කොටස් වල ව්‍යාප්ත වී ඇත.

දළ බෑවුම් සහිත කඳුකර ලක්ෂණද බෑවුම් සහිත රැලි බිම් ද හුදකලා කඳු හා තැනිතලා බිම් ද පිහිටා තිබීමෙන් මෙම කොට්ඨාසයේ භූ විෂමතාවය විවිධත්වයක් ගනී. වලල්ලාවිට, බුලත්සිංහල කොට්ඨාස වල මෙන් කඳු බෑවුම් සහිත කඳුකර ලක්ෂණද පානදුර, කළුතර මෙන් මුළුමනින්ම තැනිතලා ලක්ෂණ ද මෙම ප්‍රදේශය දක්නට නොමැත.

දළ බෑවුම් සහිත කලාප ලෙස අරකාවිල, කුරණ, කඳනපිටිය, ඌරුගල, නම්බපාන ග්‍රාම නිලධාරී වසම් ද මද බෑවුම් සහිත කලාප ලෙස ඉංගිරිය අවට හා හඳපාන්ගොඩ ග්‍රාම නිලධාරී වසම් ද නම් කළ හැකිය. කොට්ඨාසයේ උතුරු හා බටහිර මායිම් ඉතාමත් මද බෑවුම් සහිත විශේෂයෙන් තැනිතලා බිම් ප්‍රදේශ වශයෙන් හැඳින්විය හැකිය.

**එක් එක් කලාපයට අයත් බිම් ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස**

| බෑවුම් කලාප | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | ප්‍රතිශතය |
|---|---|---|
| 0.8% | 6076 | 66.07 |
| 8.16% | 1560 | 16.95 |
| 16.30% | 1095 | 11.90 |
| 30.60% | 363 | 3.94 |
| 60% ට වැඩි | 110 | 1.20 |
| එකතුව | 9204 | 100.0 |

# ග්‍රාම නිලධාරී කොට්ඨාස මායිම්




2000 වසර තෙක් හොරණ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයට අයත් ව තිබූ මෙම ප්‍රදේශය එම වසරේ අගෝස්තු 14 දින ග්‍රාම නිලධාරී වසම් 31කට වෙන් කර ඉංගිරිය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය වශයෙන් නම් කරන ලදි. හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ප්‍රදේශයක් වශයෙන් විශාල වීමත්, ජනගහනය සීඝ්‍ර වර්ධනය නිසාත් කොට්ඨාශයේ පරිපාලනය පහසුව හා ජනතාවගේ පහසුව තකා මෙසේ මෙම කලාපය බෙදා වෙන් කරන ලදි.

ප්‍රදේශයේ පිහිටි විශාලතම ග්‍රාම නිලධාරී වසම කොට්ටියාවත්ත වන අතර එය හෙක්ටයාර 10.33 කි. කලාපයේ නැගෙනහිර කොටසේ පිහිටි මෙම කොටස දළ බෑවුම් වන අතර වන වගා, වනාන්තර,රබර් හා තේ වගාවන්ගෙන් යුක්ත වන අතර ජනාවාස ද ඉතා පහත් අගයක පවතී. භූමි ප්‍රමාණය අනුව කුඩාම ග්‍රාම නිලධාරී වසම් වන්නේ කුරණ දකුණ හා කැකුළදොලයි.

## 1.2.1.ග්‍රාම නිලධාරී වසම් හා ගම් කාණ්ඩ

| ග්‍රාම නිලධාරී වසම | අයත් ගම් කාණ්ඩ | මුළු ගම් කාණ්ඩ සංඛ්‍යාව |
|---|---|---|
| 618 වගවත්ත | වගවත්ත කොටසක් , දම්මින්න කනුමස්සාගල , ගනේ තැන්න පර්ත් වත්ත කොටසක්, මානාන කොටසක් | 06 |
| 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර | බොරළුගොඩ, මානාන කොටසක්, පෝරුවදණ්ඩ නැගෙනහිර, වෝටර් ලෑන්ඩ් ජනපදය | 04 |
| 618 බී කැකුලළිය | බතලහේනපිටිය, ගෝනාවල, කැකුළලිය කොටසක්, මගුරුවල, කොස්ගහගොඩැල්ල, යහලවත්ත කොටසක්, ගල්වැටිගොඩැල්ල | 07 |
| 618 සී පෝරුවදණ්ඩ බටහිර | අරුණගම, කළුපහන, පර්ත් වත්ත කොටසක්, පෝරුවදණ්ඩ බටහිර | 04 |
| 619 ඌරුගල නැගෙනහිර | ඌරුගල, උඩහඌරුගල, මැද ඌරුගල, මඩකඩ, ගල්වැට වත්ත, ඌරුගල්කොත, කපුගස් මණ්ඩිය, සපුගහගොඩ කන්ද | 08 |
| 619 ඒ නම්බපාන | නම්බපාන,  ළවල්වතුරාන, සියාරියකොත, වෝල්ටලූ වත්ත, කැටකැඩැල්ල | 05 |
| 619 බී ඌරුගල බටහිර | ඌරුගල කොටසක්, ගල්කන්ද වත්ත, ඉඹුලහේන, ගල්කන්ද ජනපදය, මොරවින්න කොටස, ඌරුගල තොටුපල කොටස, මැද ඌරුගල, ගංගොඩ කොටස | 08 |
| 620 ඉංගිරිය නැගෙනහිර | නාගස්මණ්ඩිය, දිවුල්පත, සපුගහගොඩ කන්ද, රඹුක්කනගම, පුවක් වත්ත | 05 |
| 620 ඒ ඉංගිරිය බටහිර | අක්කර 20, එල්ස්මෝර්වත්ත, සේනානායක වත්ත | 03 |
| 620 බී රයිගම්වත්ත | රයිගම්වත්ත ඉහල කොටස, යිගම්වත්ත පහල කොටස | 02 |
| 620 සී ඉංගිරිය උතුර | ගාල්ලෙගම, ජයලත්ගම, පිබිලන්ඩගම, වෙන්දේසිවත්ත, තානායම් පෙදෙස, මීරම, දිවුල්පත, මොරවින්න, ඇලබඩපාර | 09 |

| ග්‍රාම නිලධාරී වසම | අයත් ගම් කාණ්ඩ | මුළු ගම් කාණ්ඩ සංඛ්‍යාව |
|---|---|---|
| 620 ඩී නිමලගම | ඉංගිරිය වත්ත, නිමලගම, සිසිල් උයන,<br>අක්කර 7, බෝධිරාජගම,<br>ඉසුරුපුර, ෆිනැන්ස් වත්ත, නවගම්මානය,<br>ඉංගිරිය වත්ත උඩ කොටස,<br>ඉන්ද්‍රදාස හෙට්ටිආරච්චිගම | 10 |
| 620 ඊ ඇඳූරාගල | ඇඳූරාගල, ඇඳූරාගල වත්ත,<br>මානාන කොටසක්,<br>ඉංගිරිය වත්ත උඩ කොටස | 04 |
| 620 එෆ් දොඹගස්කන්ද | දොඹගස්කන්ද,<br>විජය ගොවි ජනපදය,<br>යහල වත්ත කොටසක් | 03 |
| 620 ජී මහ ඉංගිරිය | ඇලබඩ පාර පෙදෙස,<br>ජනාධිපති මාවත පෙදෙස,<br>කටහය බෝක්කුව පෙදෙස,<br>මහ ඉංගිරිය, ඉමගිර ජනපදය,<br>ශාන්ත පීතර ජනපදය,<br>විදෙස් මිතුගම, රයිගම ජනපදය | 08 |
| 621 මාපුටුගල | ඇල්ලදොල,<br>ඇපින්පොරස්ට්වත්තකොටසක්,මැදමූකලාන,<br>මාපුටුගල, ,<br>බවුන්ඩර් පාර, ගර්ටන් වත්ත,<br>කොස් හේන, මැදිලන්ද | 08 |
| 621 ඒ<br>රත්මල්ගොඩ<br>නැගෙනහිර | ප්‍රනාන්දු පෙදෙස, හේන්යාය ,<br>ශ්‍රී ධීරානන්ද මාවත,<br>රත්මල්ගොඩ කොටසක්, බංඩිගෙ වත්ත | 05 |
| 621 බී<br>රත්මල්ගොඩ බටහිර | ගෝඩන්, කොස්වත්ත,<br>හොරකැටියවත්ත, රත්මල්ගම,<br>රත්මල්ගොඩ ජනපදය,<br>රත්මල්ගොඩ කොටසක්,<br>පහළ කුඹුර, රත්මල් තැන්න,<br>රත්මල්ගොඩ පෙදෙස,<br>කපුවැටිය පාර, කන්දහේන | 11 |
| 622 පැල්පිටිගොඩ | පැල්පිටිගොඩ,<br>පනන්ගල වත්ත, පුවක්වත්ත,<br>පහුරුතොට, පැල්පිටිගොඩ දකුණ,<br>පැල්පිටිගොඩ උතුර | 06 |
| 623<br>හඳපාන්ගොඩ දකුණ | හලේවිල, කන්දෙවත්ත,<br>කිරිගල, කිතුල්කන්ද, කෝම්පෙ,<br>වෙල ඉහල | 06 |

| ග්‍රාම නිලධාරී වසම | අයත් ගම් කාණ්ඩ | මුළු ගම් කාණ්ඩ සංඛ්‍යාව |
|---|---|---|
| 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර | බණ්ඩාර හේන, කොටිගල කොටසක්, පංසල හංදිය, පැලකැටියා වත්ත, කිරිගල කොටසක් | 05 |
| 623 බී හඳපාන්ගොඩ බටහිර | බාලගේ කොටුකැලේ, ගැටකොස්සාව, ඉදිකටු හංදිය, කොස්හේන, වෙල්පල්ල, පාසල් හන්දිය, යටවතුර පාර | 07 |
| 624 බටුගම්පල | බටුගම්පල උතුර, බටුගම්පල දකුණ, ජනඋදාන ගම්මානය, අළුතින් බෙදන ලද අක්කර 07, බටුගම්පල ජනපදය | 05 |
| 624 ඒ කැකුළදොල | කැකුළදොල , පෙට්ටගම්කන්ද | 02 |
| 625 අරකාවිල | අරකාවිල, කොස්හේන ජනපදය , ගනෙල්ලාගොඩ, ලිහිණියාවත්ත, | 04 |
| 625 ඒ මෙනේරිගම | මෙනේරිගම, මෙනේරිගම වත්ත, කදුගොඩ, දෙල් වත්ත, කොස් හේන කොටසක් | 05 |
| 626 කදනපිටිය | කදනපිටිය, කටුගාල්ගම, පොල්ගහතොට, ගොඩපර හේන | 04 |
| 626ඒ කොට්ටියාවත්ත | බඹරලිය, කොට්ටියාවත්ත, මඩකඩ, මැරේකන්ද, ගිරංචි කන්ද, පැලුමගල, | 06 |
| 627 කුරණ දකුණ | අක්කර 15, අක්කර 40, අක්කර 60, කුරණ ගම්ගොඩ, අක්කර 36, | 05 |
| 627 ඒ කොටිගල | කොටිගල, අඹේපිටිය වත්ත, හිගුරෙගෙවත්ත (අක්කර 09), වෙළ ඉහළ | 04 |
| 627 බී කුරණ උතුර | ඇලපාතගොඩ, ගිරංචිකන්ද, නැදුන්ගස්මණ්ඩිය, කුරා උඩ, දුල්ලැහැර | 05 |
| | | 182 |

මූලාශ්‍රය :- සංවර්ධන නිලධාරී දත්ත එකතුව 2019

# කොට්ඨාස සිතියම



Gramaniladari Divisions - Ingiriya D.S Division
625 Arakawila
627B Kurana North
625A Meewitigama
627A Kotapola
627 Kurana South
623A Handapangoda East
623B Handapangoda West
623 Handapangoda South
624 Batagampala
624A Kekuladola
620H Raigam Watta
622 Pelpitigoda
620G Maha Ingiriya
620D Nambapana
621A Rathmalgoda East
621 Maputugala
620E Ekkanagala
620 Ingiriya East
621B Rathmalgoda West
620C Ingiriya North
619A Nambapana
620A Ingiriya West
618A Poruwadanda East
620F Dombagaskanda
619 Urapola East
618B Kekulandala
619B Urapola West
618C Poruwadanda West
618 Wagawatta
Map prepared by District Land Use Planning Office - Kalutara
1:30,000

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසම |
|---|---|
| 01. | 618 වගවත්ත |
| 02. | 618 ඒ පෝරුවදන්ඩ නැගෙනහිර |
| 03. | 618 බී කැකුළලිය |
| 04. | 618 සී පෝරුවදන්ඩ බටහිර |
| 05. | 619 ඌරුගල නැගෙනහිර |
| 06. | 619 ඒ නම්බපාන |
| 07. | 619 බී ඌරුගල බටහිර |
| 08. | 620 ඉංගිරිය නැගෙනහිර |
| 09. | 620 ඒ ඉංගිරිය බටහිර |
| 10. | 620 බී රයිගම් වත්ත |
| 11. | 620 සී ඉංගිරිය උතුර |
| 12. | 620 ඩී නිමලගම |
| 13. | 620 ඊ ඇදුරාගල |
| 14. | 620 එෆ් දොඹගස්කන්ද |
| 15. | 620 ජී මහ ඉංගිරිය |
| 16. | 621 මාපුටුගල |
| 17. | 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර |
| 18. | 621 බී රත්මල්ගොඩ බටහිර |
| 19. | 622 පැල්පිටිගොඩ |
| 20. | 623 හඳපාන්ගොඩ දකුණ |
| 21. | 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර |
| 22. | 620 බී හඳපාන්ගොඩ බටහිර |
| 23. | 624 බටුගම්පල |
| 24. | 624 ඒ කැකුළදොල |
| 25. | 625 අරකාවිල |
| 26. | 625 ඒ මෙනේරිගම |
| 27. | 626 කඳනපිටිය |
| 28. | 626 ඒ කොට්ටියාවත්ත |
| 29. | 627 කුරණ දකුණ |
| 30. | 627 ඒ කොටිගල |
| 31 | 623 බී කුරණ උතුර |

## 1.2.2. පරිපාලන ව්‍යුහය

### රෙජිස්ට්‍රාර් කොට්ඨාස



| රෙජිස්ට්‍රාර් කොට්ඨාසය | අයත් වන ග්‍රාම නිලධාරී වසම් |
|---|---|
| කළුපහණ | 618 වගවත්ත |
| | |
| රත්මල්ගොඩ | 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර |
| | 618 බී කැකුළලිය |
| | 618 සී පෝරුවදණ්ඩ බටහිර |
| | 621 මාපුටුගල |
| | 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර |
| | 621 බී රත්මල්ගොඩ බටහිර |
| | 622 පැල්පිටිගොඩ |
| | |
| ඉංගිරිය I | 620 ඉංගිරිය නැගෙනහිර |
| | 620 ඒ ඉංගිරිය බටහිර |
| | 620 සී ඉංගිරිය උතුර |
| | 620 ඒෆ් දොඹගස්කන්ද |
| | |
| ඉංගිරිය II | 620 ඩී නිමලගම |
| | 620 ඊ ඇදුරගල |
| | 620 ජී මහ ඉංගිරිය |
| | 624 බටුගම්පොල |
| | 624 ඒ කැකුළදොළ |
| | |
| ඌරුගල | 619 ඌරුගල නැගෙනහිර |
| | 619 ඒ නම්බපාන |
| | 619 බී ඌරුගල බටහිර |
| | |
| අරකාවිල | 623 හඳපාන්ගොඩ දකුණ |
| | 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර |
| | 623 බී හඳපාන්ගොඩ බටහිර |
| | 625 අරකාවිල |
| | 625 ඒ මෙනේරිගම |
| | 626 කඳනපිටිය |
| | 626 ඒ කොට්ටියාවත්ත |
| | 627 කුරණ දකුණ |
| | 627 ඒ කොටිගල |
| | 627 බී කුරණ උතුර |

මූලාශ්‍රය :- රෙජිස්ට්‍රාර් අංශය, ප්‍රා.ලේ.කා. - ඉංගිරිය

# සමෘද්ධි කලාප


SAMUDHRI BENEFICIARIES ZONES
INGIRIYA DS DIVISION
N
Samudhri Beneficiaries Zones
Hadapangoda Zone
Ingiriya Zone
Poruwadanda Zone
0
1,150
2,300
4,600
Meters
Prepared by Land Use Planning Office : Kalutara

| කලාපය | වසම |
|---|---|
| පෝරුවදණ්ඩ | 618 වගවත්ත |
| | 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර |
| | 618 බී කැකුළලිය |
| | 618 සී පෝරුවදණ්ඩ බටහිර |
| | 621 මාපුටුගල |
| | 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර |
| | 621 බී රත්මල්ගොඩ බටහිර |
| | 622 පැල්පිටිගොඩ |
| | 624 බටුගම්පල |
| | 624 ඒ කැකුළදොළ |
| | |
| ඉංගිරිය | 619 ඌරුගල නැගෙනහිර |
| | 619 ඒ නම්බපාන |
| | 619 බී ඌරුගල බටහිර |
| | 620 ඉංගිරිය නැගෙනහිර |
| | 620 ඒ ඉංගිරිය බටහිර |
| | 620 බී රයිගම්වත්ත |
| | 620 සී ඉංගිරිය උතුර |
| | 620 ඩී නිමලගම |
| | 620 ඊ ඇදුරගල |
| | 620 එෆ් දොඹගස්කන්ද |
| | 620 ජී මහ ඉංගිරිය |
| | |
| හඳපාන්ගොඩ | 623 හඳපාන්ගොඩ දකුණ |
| | 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර |
| | 623 බී හඳපාන්ගොඩ බටහිර |
| | 625 අරකාවිල |
| | 625 ඒ මෙනේරිගම |
| | 626 කඳනපිටිය |
| | 626 ඒ කොට්ටියාවත්ත |
| | 627 කුරණ දකුණ |
| | 627 ඒ කොටිගල |
| | 627 බී කුරණ උතුර |

මූලාශ්‍රය :- සමෘද්ධි මූලස්ථානය , ප්‍රා.ලේ.කා. - ඉංගිරිය

# ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පොලිස්බල ප්‍රදේශ

| හොරණ පොලිස් බල ප්‍රදේශ | |
|---|---|
| 618 | වගවත්ත |
| 618 ඒ | පෝරුවදණ්ඩ නැගෙනහිර |
| 618 බී | කැකුලළිය |
| 618 සී | පෝරුවදණ්ඩ බටහිර |
| **ඉංගිරිය පොලිස් බල ප්‍රදේශ** | |
| 619 | ඌරුගල නැගෙනහිර |
| 619 ඒ | නම්බපාන |
| 619 බී | ඌරුගල බටහිර |
| 620 | ඉංගිරිය නැගෙනහිර |
| 620 ඒ | ඉංගිරිය බටහිර |
| 620 බී | රයිගම්වත්ත |
| 620 සී | ඉංගිරිය උතුර |
| 620 ඩී | නිමලගම |
| 620 ඊ | ඇදුරාගල |
| 620 එෆ් | දොඹගස්කන්ද |
| 621 ජී | මහ ඉංගිරිය |
| 621 | මාපුටුගල |
| 621 ඒ | රත්මල්ගොඩ නැගෙනහිර |
| 621 බී | රත්මල්ගොඩ බටහිර |
| 622 | පැල්පිටිගොඩ |
| 623 | හඳපාන්ගොඩ දකුණ |
| 623 ඒ | හඳපාන්ගොඩ නැගෙනහිර |
| 623 බී | හඳපාන්ගොඩ බටහිර |
| 624 | බටුගම්පල |
| 624 ඒ | කැකුළදොල |
| 625 | අරකාවිල |
| 625 ඒ | මෙනේරිගම |
| 626 | කඳනපිටිය |
| 626 ඒ | කොට්ටියාවත්ත |
| 627 | කුරණ දකුණ |
| 627 ඒ | කොටිගල |
| 627 බී | කුරණ උතුර |

මූලාශ්‍රය :- මහජන සම්බන්ධතා නිලධාරී දත්ත එකතුව

# සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශය



# ගොවිජන සේවා බල ප්‍රදේශ



# 1.3. දේශගුණික හා කාලගුණික තොරතුරු

## වර්ෂාපතනය



ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට මි.මී. 3500 – 4500 අතර වර්ෂාපතනයක් ලැබෙන අතර වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මිලි මීටර් 4200 තරම් වේ. මෙම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තෙත් කලාපීය පහත් බිම් කලාපයට අයත් වීම නිසා ඊසාන දිග හා නිරිත දිග මෝසම් දෙකෙන්ම වර්ෂාව ලැබෙන කාල පරිච්ඡේදය පහත පරිදි වේ.

1. අන්තර් මෝසම් කාල පරිච්ඡේදය - මාර්තු - අප්‍රියෙල්
2. නිරත දිග මෝසම් කාල පරිච්ඡේදය - මැයි මැද - සැප්තැම්බර් මැද
3. අන්තර් මෝසම් කාල පරිච්ඡේදය - සැප්තැම්බර් - ඔක්තොම්බර්
4. ඊසාන දිග මෝසම් කාල පරිච්ඡේදය - නොවැම්බර් - ජනවාරි මැද

කොට්ඨාසය තුළ පවතින උෂ්ණත්ව අගයන් හා වර්ෂාපතන තත්ත්වයන් පහත පරිදි වේ.

| **මාසය** | **වාර්ෂික සාමාන්‍ය වර්ෂාපතනය මිලිමීටර්** | **මාසික සාමාන්‍ය වර්ෂාපතනය සහිත දින ගණන** | **සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක** |
|---|---|---|---|
| ජනවාරි | 96 | 03 | 27.2 |
| පෙබරවාරි | 487 | 11 | 27.8 |
| මාර්තු | 275 | 10 | 28.3 |
| අප්‍රේල් | 465 | 19 | 28.3 |
| මැයි | 152 | 10 | 27.9 |
| ජුනි | 323 | 23 | 27.3 |
| ජූලි | 158 | 07 | 27.1 |
| අගෝස්තු | 386 | 18 | 27.1 |
| සැප්තැම්බර් | 381 | 16 | 27.0 |
| ඔක්තෝම්බර් | 914 | 19 | 27.1 |
| නොවැම්බර් | 470 | 10 | 27.1 |
| දෙසැම්බර් | 482 | 15 | 27.1 |
| **වාර්ෂික** | **4589** | **161** | **27.5** |

# දෙවන පරිච්ඡේදය

# ජනගහනය

# 2.1. ජනසණත්වය හා ව්‍යාප්තිය

ඉංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුළු ජනගහනය 59,977 කි. මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 9204 (ව.කි.92.04) කි. එය ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ව්‍යාප්ත වී ඇති ආකාරය අනුව පහත සඳහන් ආකාරයට දැක්විය හැකිය.

## ග්‍රාම නිලධාරී වසම් අනුව ජන සනත්වය

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසමේ නම | මුළු ජනගහනය | විශාලත්වය (ව.කි.) | ජන සනත්වය | පවුල් සංඛ්‍යාව | ගෘහ ඒකක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 1. | 618 වගවත්ත | 2284 | 7.21 | 316.7 | 635 | 606 |
| 2. | 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර | 3676 | 2.5 | 1470.4 | 944 | 922 |
| 3. | 618 බී කැකුළලිය | 1060 | 1.75 | 605.7 | 272 | 236 |
| 4. | 618 සී පෝරුවදණ්ඩ බටහිර | 3477 | 1.12 | 3104.4 | 887 | 868 |
| 5. | 619 ඌරුගල නැගෙනහිර | 2423 | 1.76 | 1376.7 | 614 | 605 |
| 6. | 619 ඒ නම්බපාන | 1281 | 2.5 | 512.4 | 401 | 386 |
| 7. | 619 බී ඌරුගල බටහිර | 2044 | 1.9 | 1075.7 | 522 | 513 |
| 8. | 620 ඉංගිරිය නැගෙනහිර | 1754 | 2.42 | 724.7 | 454 | 422 |
| 9. | 620 ඒ ඉංගිරිය බටහිර | 2095 | 1.62 | 1293.2 | 608 | 517 |
| 10. | 620 බී රයිගම් වත්ත | 2570 | 5.02 | 511.9 | 532 | 425 |
| 11. | 620 සී ඉංගිරිය උතුර | 2590 | 1.6 | 1618.7 | 745 | 725 |
| 12. | 620 ඩී නිමලගම | 4148 | 3.2 | 1296.2 | 1076 | 1049 |
| 13. | 620 ඊ ඇඳුරාගල | 1243 | 3.3 | 376.6 | 405 | 365 |
| 14. | 620 එෆ් දොඹගස්කන්ද | 1487 | 1.6 | 929.3 | 583 | 515 |
| 15. | 620 ජී මහ ඉංගිරිය | 3721 | 3.46 | 1084.8 | 1039 | 921 |
| 16. | 621 මාපුටුගල | 2271 | 6.46 | 351.5 | 655 | 605 |

| අනු අංකය | ග්‍රාම නිලධාරී වසමේ නම | මුළු ජනගහනය | විශාලත්වය (ව.කි.) | ජන සනත්වය | පවුල් සංඛ්‍යාව | ගෘහ ඒකක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| 17. | 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර | 1400 | 2.75 | 509 | 375 | 362 |
| 18. | 621 බී රත්මල්ගොඩ බටහිර | 1973 | 1.73 | 1140.4 | 627 | 620 |
| 19. | 622 පැල්පිටිගොඩ | 2133 | 1.25 | 1706.4 | 577 | 576 |
| 20. | 623 හඳපාන්ගොඩ දකුණ | 1278 | 2.01 | 635.8 | 355 | 338 |
| 21. | 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර | 1276 | 1.9 | 671.5 | 332 | 332 |
| 22. | 620 බී හඳපාන්ගොඩ බටහිර | 1380 | 1.83 | 754.09 | 380 | 365 |
| 23. | 624 බටුගම්පල | 1449 | 2.5 | 579.6 | 435 | 405 |
| 24. | 624 ඒ කැකුළදොල | 490 | 1.25 | 392 | 146 | 136 |
| 25. | 625 අරකාවිල | 2495 | 5.01 | 498 | 628 | 548 |
| 26. | 625 ඒ මෙනේරිගම | 1478 | 4.5 | 328.4 | 397 | 365 |
| 27. | 626 කඳනපිටිය | 1878 | 5.56 | 337.7 | 557 | 538 |
| 28. | 626 ඒ කොට්ටියාවත්ත | 1172 | 10.33 | 113.4 | 332 | 312 |
| 29. | 627 කුරණ දකුණ | 1611 | 1.2 | 1342.5 | 433 | 398 |
| 30. | 627 ඒ කොටිගල | 960 | 1.3 | 738.4 | 285 | 270 |
| 31. | 623 බී කුරණ උතුර | 916 | 1.3 | 704.6 | 263 | 259 |
| | **එකතුව** | **59,977** | **92.04** | **27100.69** | **16,494** | **15,504** |

මූලාශ්‍රය :- සංවර්ධන නිලධාරී දත්ත 2020

# 2.2. වයස් මට්ටම් අනුව ජනගහනය

| ග්‍රාම නිලධාරී වසමේ නම | 0-5 | | 06-19 | | 20-35 | | 36-59 | | 60 ට වැඩි | | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | | |
| 618 වගවත්ත | 45 | 41 | 213 | 218 | 298 | 268 | 424 | 414 | 184 | 179 | 1164 | 1120 |
| 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර | 135 | 121 | 289 | 287 | 421 | 418 | 727 | 703 | 293 | 279 | 1868 | 1808 |
| 618 බී කැකුළලිය | 100 | 131 | 65 | 75 | 36 | 65 | 249 | 190 | 53 | 96 | 503 | 557 |
| 618 සී පෝරුවදණ්ඩ බටහිර | 118 | 109 | 291 | 330 | 391 | 382 | 588 | 553 | 343 | 372 | 1731 | 1746 |
| 619 ඌරුගල නැගෙනහිර | 45 | 51 | 287 | 265 | 259 | 252 | 362 | 349 | 281 | 272 | 1234 | 1189 |
| 619 ඒ නම්බපාන | 26 | 22 | 134 | 128 | 297 | 288 | 110 | 105 | 87 | 84 | 654 | 627 |
| 619 බී ඌරුගල බටහිර | 59 | 62 | 171 | 136 | 291 | 202 | 467 | 378 | 166 | 112 | 1154 | 890 |
| 620 ඉංගිරිය නැගෙනහිර | 43 | 50 | 224 | 245 | 182 | 179 | 286 | 253 | 154 | 138 | 889 | 865 |
| 620 ඒ ඉංගිරිය බටහිර | 65 | 56 | 170 | 116 | 295 | 310 | 304 | 330 | 225 | 188 | 1059 | 1000 |
| 620 බී රයිගම් වත්ත | 205 | 180 | 193 | 176 | 320 | 288 | 387 | 331 | 195 | 325 | 1300 | 1270 |
| 620 සී ඉංගිරිය උතුර | 85 | 54 | 504 | 505 | 289 | 279 | 229 | 253 | 205 | 190 | 1309 | 1281 |
| 620 ඩී නිමලගම | 141 | 134 | 587 | 568 | 327 | 289 | 844 | 777 | 280 | 201 | 2179 | 1969 |
| 620 ඊ ඇදුරාගල | 34 | 37 | 102 | 98 | 122 | 139 | 262 | 232 | 120 | 97 | 640 | 603 |
| 620 එෆ් දොඹගස්කන්ද | 32 | 34 | 127 | 125 | 232 | 225 | 244 | 237 | 121 | 110 | 756 | 731 |
| 620 ජී මහ ඉංගිරිය | 241 | 152 | 198 | 213 | 482 | 451 | 658 | 624 | 374 | 328 | 1953 | 1768 |
| 621 මාපුටුගල | 47 | 62 | 174 | 189 | 225 | 257 | 459 | 463 | 241 | 154 | 1146 | 1125 |
| 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර | 43 | 36 | 101 | 118 | 156 | 159 | 294 | 249 | 126 | 118 | 720 | 680 |
| 621 බී රත්මල්ගොඩ බටහිර | 183 | 190 | 192 | 184 | 217 | 203 | 233 | 167 | 198 | 176 | 1023 | 950 |
| 622 පැල්පිටිගොඩ | 232 | 228 | 229 | 219 | 235 | 221 | 227 | 229 | 147 | 166 | 1070 | 1063 |

| ග්‍රාම නිලධාරී වසමේ නම | 0-5 | | 06-19 | | 20-35 | | 36-59 | | 60 ට වැඩි | | ස්ත්‍රී | පුරුෂ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | ස්ත්‍රී | පුරුෂ | | |
| 623 හඳපාන්ගොඩ දකුණ | 31 | 31 | 134 | 131 | 133 | 124 | 220 | 224 | 144 | 106 | 662 | 616 |
| 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර | 32 | 26 | 204 | 142 | 165 | 115 | 220 | 179 | 121 | 72 | 742 | 534 |
| 620 බී හඳපාන්ගොඩ බටහිර | 40 | 26 | 155 | 135 | 152 | 142 | 275 | 247 | 113 | 95 | 735 | 645 |
| 624 බටුගම්පල | 06 | 09 | 171 | 170 | 174 | 186 | 178 | 189 | 176 | 190 | 705 | 744 |
| 624 ඒ කැකුළදොල | 09 | 10 | 38 | 16 | 59 | 45 | 105 | 68 | 84 | 56 | 295 | 195 |
| 625 අරකාවිල | 133 | 127 | 204 | 201 | 381 | 388 | 360 | 366 | 190 | 145 | 1268 | 1227 |
| 625 ඒ මෙනේරිගම | 70 | 29 | 113 | 177 | 67 | 80 | 420 | 317 | 92 | 113 | 762 | 716 |
| 626 කඳනපිටිය | 89 | 74 | 150 | 142 | 187 | 184 | 320 | 315 | 211 | 206 | 957 | 921 |
| 626 ඒ කොට්ටියාවත්ත | 118 | 117 | 120 | 114 | 115 | 118 | 118 | 116 | 116 | 120 | 587 | 585 |
| 627 කුරණ දකුණ | 58 | 44 | 174 | 155 | 141 | 185 | 273 | 289 | 160 | 132 | 806 | 805 |
| 627 ඒ කොටිගල | 30 | 23 | 71 | 72 | 118 | 120 | 190 | 162 | 81 | 93 | 490 | 470 |
| 623 බී කුරණ උතුර | 30 | 26 | 151 | 139 | 36 | 22 | 165 | 176 | 89 | 82 | 471 | 445 |
| | | | | | | | | | | | 30832 | 29145 |

මූලාශ්‍රය :- සංවර්ධන නිලධාරී දත්ත 2020

# 2.3 ජනවර්ග අනුව හා ආගම් අනුව ජන ව්‍යාප්තිය

## ජනවර්ග අනුව ජනගහනය

| ග්‍රාම නිලධාරී වසමේ නම | ජනගහනය ජාතීන් අනුව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සිංහල | | දෙමළ | | මුස්ලිම් | | බර්ගර් | | මැලේ (වෙනත්) | |
| | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
| 618 වගවත්ත | 1752 | 488 | 532 | 147 | - | - | - | - | - | - |
| 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර | 3627 | 932 | 46 | 11 | 03 | 01 | - | - | - | - |
| 618 බී කැකුළලිය | 1060 | 272 | - | - | - | - | - | - | - | - |
| 618 සී පෝරුවදණ්ඩ බටහිර | 2606 | 661 | 866 | 221 | 05 | 05 | | | | |
| 619 ඌරුගල නැගෙනහිර | 2417 | 612 | 06 | 02 | - | - | - | - | - | - |
| 619 ඒ නම්බපාන | 1249 | 394 | 32 | 07 | - | - | - | - | - | - |
| 619 බී ඌරුගල බටහිර | 2017 | 516 | 27 | 06 | - | - | - | - | - | - |
| 620 ඉංගිරිය නැගෙනහිර | 1747 | 449 | 07 | 05 | - | - | 01 | 01 | - | - |
| 620 ඒ ඉංගිරිය බටහිර | 2025 | 603 | 34 | 05 | - | - | - | - | - | - |
| 620 බී රයිගම් වත්ත | 120 | 16 | 2440 | 514 | 10 | 02 | - | - | - | - |
| 620 සී ඉංගිරිය උතුර | 2534 | 727 | 31 | 11 | 08 | 03 | 05 | 01 | 12 | 03 |
| 620 ඩී නිමලගම | 3212 | 856 | 918 | 216 | 08 | 02 | 08 | 02 | - | - |
| 620 ඊ ඇදුරාගල | 675 | 240 | 568 | 165 | - | - | - | - | - | - |
| 620 එෆ් දොඹගස්කන්ද | 1482 | 580 | 04 | 02 | - | - | - | - | 01 | 01 |
| 620 ජී මහ ඉංගිරිය | 3234 | 908 | 486 | 131 | 01 | - | - | - | - | - |
| 621 මාපුටුගල | 2183 | 633 | 69 | 15 | 01 | 01 | - | - | 18 | 06 |
| 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර | 1370 | 368 | 29 | 06 | 01 | 01 | - | - | - | - |
| 621 බී රත්මල්ගොඩ බටහිර | 1968 | 626 | 05 | 01 | - | - | - | - | - | - |
| 622 පැල්පිටිගොඩ | 2128 | 576 | 05 | 01 | - | - | - | - | - | - |
| 623 හඳපාන්ගොඩ දකුණ | 1268 | 354 | 10 | 01 | - | - | - | - | - | - |

| ග්‍රාම නිලධාරී වසමේ නම | ජනගහනය ජාතීන් අනුව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සිංහල | | දෙමළ | | මුස්ලිම් | | බර්ගර් | | මැලේ (වෙනත්) | |
| | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
| 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර | 1272 | 329 | 03 | 02 | 01 | 01 | - | - | - | - |
| 620 බී හඳපාන්ගොඩ බටහිර | 1369 | 376 | 10 | 03 | 01 | 01 | - | - | - | - |
| 624 බටුගම්පල | 1446 | 434 | 03 | 01 | - | - | - | - | - | - |
| 624 ඒ කැකුළදොල | 490 | 146 | - | - | - | - | - | - | - | - |
| 625 අරකාවිල | 2491 | 624 | 01 | 01 | 01 | 01 | 02 | 02 | - | - |
| 625 ඒ මෙනේරිගම | 1428 | 387 | 50 | 10 | - | - | - | - | - | - |
| 626 කඳනපිටිය | 1176 | 557 | 01 | - | 01 | - | - | - | - | - |
| 626 ඒ කොට්ටියාවත්ත | 1162 | 329 | 08 | 02 | - | - | - | - | 02 | 01 |
| 627 කුරණ දකුණ | 1598 | 427 | 13 | 06 | - | - | - | - | - | - |
| 627 ඒ කොටිගල | 947 | 282 | 13 | 03 | - | - | - | - | - | - |
| 623 බී කුරණ උතුර | 903 | 260 | 13 | 03 | - | - | - | - | - | - |
| | **53658** | | **6230** | | **41** | | **13** | | **35** | |

මූලාශ්‍රය :- සංවර්ධන නිලධාරී දත්ත 2020

# ආගම් අනුව ජනගහනය

| ග්‍රාම නිලධාරී වසමේ නම | ජනගහනය ආගම් අනුව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බෞද්ධ | | හින්දු | | කතෝලික | | ඉස්ලාම් | | වෙනත් | |
| | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
| 618 වගවත්ත | 1752 | 488 | 451 | 128 | 81 | 19 | - | - | - | - |
| 618 ඒ පෝරුවදණ්ඩ නැගෙනහිර | 3621 | 930 | 45 | 11 | 07 | 02 | 03 | 01 | - | - |
| 618 බී කැකුළලිය | 1060 | 272 | - | - | - | - | - | - | - | - |
| 618 සී පෝරුවදණ්ඩ බටහිර | 2597 | 640 | 717 | 205 | 158 | 37 | 05 | 05 | - | - |
| 619 ඌරුගල නැගෙනහිර | 2417 | 612 | 06 | 02 | - | - | - | - | - | - |
| 619 ඒ නම්බපාන | 1249 | 394 | 32 | 07 | - | - | - | - | - | - |
| 619 බී ඌරුගල බටහිර | 2017 | 516 | 20 | 04 | 07 | 02 | - | - | - | - |
| 620 ඉංගිරිය නැගෙනහිර | 1747 | 447 | - | - | 07 | 07 | - | - | - | - |
| 620 ඒ ඉංගිරිය බටහිර | 2018 | 603 | 34 | 03 | 04 | 01 | - | - | - | - |
| 620 බී රයිගම් වත්ත | 120 | 16 | 2420 | 514 | 20 | - | 10 | 02 | - | - |
| 620 සී ඉංගිරිය උතුර | 2534 | 727 | 31 | 11 | 05 | 01 | 08 | 03 | 12 | 03 |
| 620 ඞී නිමලගම | 3163 | 856 | 688 | 133 | 08 | 02 | 117 | 46 | 172 | 39 |
| 620 ඊ ඇදුරාගල | 675 | 240 | 555 | 162 | 13 | 03 | - | - | - | - |
| 620 එෆ් දොඹගස්කන්ද | 1475 | 581 | 08 | 02 | 03 | - | - | - | 01 | - |
| 620 ජී මහ ඉංගිරිය | 3216 | 903 | 483 | 129 | 22 | 07 | - | - | - | - |
| 621 මාපුටුගල | 2183 | 633 | 69 | 15 | 03 | 01 | 01 | | 18 | 06 |
| 621 ඒ රත්මල්ගොඩ නැගෙනහිර | 1391 | 366 | 06 | 06 | 02 | 02 | 01 | 01 | - | - |
| 621 බී රත්මල්ගොඩ බටහිර | 1961 | 626 | 05 | 01 | 07 | - | - | - | - | - |
| 622 පැල්පිටිගොඩ | 2128 | 576 | 05 | 01 | - | - | - | - | - | - |
| 623 හඳපාන්ගොඩ දකුණ | 1265 | 354 | 10 | 01 | 03 | - | - | - | - | - |

| ග්‍රාම නිලධාරී වසමේ නම | ජනගහනය ආගම් අනුව | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | බෞද්ධ | | හින්දු | | කතෝලික | | ඉස්ලාම් | | වෙනත් | |
| | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව | ජන සංඛ්‍යාව | පවුල් සංඛ්‍යාව |
| 623 ඒ හඳපාන්ගොඩ නැගෙනහිර | 1271 | 328 | 03 | 02 | 01 | 01 | 01 | 01 | - | - |
| 623 බී හඳපාන්ගොඩ බටහිර | 1369 | 376 | 10 | 03 | - | - | 01 | 01 | - | - |
| 624 බටුගම්පල | 1446 | 434 | 03 | 01 | - | - | - | - | - | - |
| 624 ඒ කැකුළදොල | 485 | 144 | - | - | 05 | 02 | - | - | - | - |
| 625 අරකාවිල | 2491 | 624 | 01 | 01 | 02 | 02 | 01 | 01 | - | - |
| 625 ඒ මෙනේරිගම | 1408 | 382 | 50 | 10 | 20 | 05 | - | - | - | - |
| 626 කඳනපිටිය | 1857 | 557 | 01 | - | - | - | 01 | - | - | - |
| 626 ඒ කොට්ටියාවත්ත | 1164 | 330 | 08 | 02 | - | - | - | - | - | - |
| 627 කුරණ දකුණ | 1598 | 427 | 13 | 06 | - | - | - | - | - | - |
| 627 ඒ කොටිගල | 946 | 280 | 10 | 03 | 04 | 02 | - | - | - | - |
| 627 බී කුරණ උතුර | 903 | 260 | 06 | 01 | 07 | 02 | - | - | - | - |
| | 53543 | | 5690 | | 498 | | 40 | | 206 | |

මූලාශ්‍රය :- සංවර්ධන නිලධාරී දත්ත 2020

# 2.4 ලියාපදිංචි ඡන්දදායකයින්

| අනු අංකය | ඡන්ද කොට්ඨාස අංක | ඡන්ද මධ්‍යස්ථානයේ නම | ඡන්දය ප්‍රකාශ කරන ග්‍රා.නි. වසම/වසම් | ඡන්ද ගණන |
|---|---|---|---|---|
| 1 | 31 | දේවරක්ශිතාරාම විහාරස්ථ ධර්ම ශාලාව | 618 - වගවත්ත | 1569 |
| 2 | 32 | කැකුළලිය සිරිනිකේතනාරාම විහාරස්ථ ධර්ම ශාලාව | 618 බී - කැකුළලිය | 1098 |
| 3 | 33 | බොරළුගොඩ ශ්‍රී රුවන් බෝධි විහාරස්ථානයේ ධර්මශාලාව | 618 ඒ - පෝරුවදණ්ඩ නැගෙනහිර | 2378 |
| 4 | 34 | මානාන ශ්‍රී ඥාණාරතන කනිෂ්ඨ විද්‍යාලය | 618 සී -පෝරුවදණ්ඩ බටහිර | 510 |
| 5 | 35 | පොරුවදණ්ඩ කළුපහන කනිෂ්ඨ විද්‍යාලය | 618 සී -පෝරුවදණ්ඩ බටහිර | 1806 |
| 6 | 36 | ඌරුගල ධර්මාලෝක කනිෂ්ඨ විද්‍යාලය - ශාලා අංක 01 ( පිරිමි) | 619 - ඌරුගල නැගෙනහිර | 1264 |
| 7 | | ඌරුගල ධර්මාලෝක කනිෂ්ඨ විද්‍යාලය - ශාලා අංක 02 (ගැහැණු) | 619 - ඌරුගල නැගෙනහිර | 1314 |
| 8 | 37 | නම්බපාන කනිෂ්ඨ විද්‍යාලය | 619 ඒ - නම්බපාන | 966 |
| 9 | 38 | ඉංගිරිය උතුර ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය - ශාලා අංක 01 ( පිරිමි) | 620 සී - ඉංගිරිය උතුර | 2281 |
| 10 | | ඉංගිරිය උතුර ගාමිණී මධ්‍ය මහා විද්‍යාලය - ශාලා අංක 02 ( ගැහැණු) | 620 සී - ඉංගිරිය උතුර | 2482 |
| 11 | 39 | ඉංගිරිය ශ්‍රී සුමනජෝති ප්‍රාථමික විද්‍යාලයශාලා අංක 01 ( පිරිමි) | 620 සී - ඉංගිරිය උතුර | 1176 |
| 12 | | ඉංගිරිය ශ්‍රී සුමනජෝති ප්‍රාථමික විද්‍යාලය ශාලා අංක 02 ( ගැහැණු) | 620 සී - ඉංගිරිය උතුර | 1275 |
| 13 | 40 | කැකුළලිය ප්‍රාථමික විද්‍යාලය ශාලා අංක 01 ( පිරිමි) | 620 එෆ් - දොඹගස්කන්ද | 1170 |
